# <u>විශේෂ නිවේදනයයි</u>

## <u>වයඹ පළාතේ, පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් පරීක්ෂා කිරීමේ කිරීමේ සම්මුඛ පරීක්ෂණය -2024.03.05 / 06</u>

2023.09.01 දිනැති අංක 2348 දරණ රජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද බඳවාගැනීමේ නිවේදනය අනුව 2023.11.11 දින පැවැත්වූ තරඟ විභාගයේ ප්‍රතිඵල මත සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරික්ෂණ 2024.03.05 සහ 2024.03.06 යන දිනවලදී වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

* සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවන අයදුම්කරුවන්ගේ නම් සහ සම්මුඛ පරීක්ෂණ පවත්වන දින සහිත ලේඛනය මෙම වෙබ් අඩවියේ (psc.nw.gov.lk) පළ කර ඇත.

02. සුදුසුකම් සනාථ කිරීම සඳහා පහත සඳහන් I සිට VI දක්වා ලිපිලේඛන වල මුල්පිටපත් හා ඔබ විසින් මුල් ලේඛනවල සත්‍ය පිටපත් බවට සහතික කරන ලද **<u>ඡායා පිටපත් කට්ටල දෙකක්,</u>** ද සමඟ VII හා VIII ලේඛනවල මුල් පිටපත් ද රැගෙන නියමිත දින නියමිත වේලාවට වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණයේ ඔබට අදාල සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පැමිණෙන ලෙස කාරුණිකව දන්වමි.

I. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
II. උප්පැන්න සහතිකය.
III. අ.පො.ස. (සා.පෙ.) සහතිකය.
IV. අ.පො.ස. (උ.පෙ.) සහතිකය.
V. උපාධි සහතිකය.
VI. වලංගු දිනය හා විෂයයන් ඇතුළත් විස්තරාත්මක උපාධි සහතිකය. **(පන්ති සාමාර්ථය සඳහා ලකුණු ලබාදෙන බැවින් මෙම සහතිකය පසුව ඉදිරිපත් කිරීමට අවසර දෙනු නොලැබේ.)**
VII. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී විසින් DS4 ආකෘතියෙන් නිකුත් කරනු ලබන ග්‍රාම නිලධාරී සහතිකය. (අයදුම්කරු වයඹ පළාත තුළ පූර්වාසන්න වසර තුනක ස්ථිර පදිංචිය සනාථ කළ යුතු අතර ග්‍රාම නිලධාරී සහතිකයෙන් වසර තුනක පදිංචිය තහවුරු නොවන අවස්ථාවල දී කලත්‍රයා වයඹ පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු නම් කලත්‍රයාගේ පදංචි සහතිකය සමග විවාහ සහතිකය හෝ අයදුම්කරු වයඹ පළාතේ ම වෙනත් ග්‍රාම නිලධාරී වසමක පදිංචිව සිටියේ නම් පෙර පදිංචිය හැරයාම පිළිබඳ අදාල ග්‍රාම නිලධාරී විසින් ලබා දෙන ලිපියක් මගින් හෝ වයඹ පළාත තුළ පූර්වාසන්න වසර තුනක ස්ථිර පදිංචිය සනාථ කළ හැකිය)
VIII. උප්පැන්න සහතිකය, හැඳුනුම්පත හෝ අධ්‍යාපන සහතිකවල සඳහන් නම් අතර කිසියම් වෙනසක් ඇත්නම් ඒ බව සනාථ කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශය.

03. ගැසට් නිවේදනයේ 8.4 (ආ) ඡේදයේ සඳහන් පරිදි මෙම සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් සහතිකවලට ලකුණු ලබාදීමට නියමිත හෙයින් එම සහතික වල මුල් පිටපත් සහ ඔබ විසින් සහතික කළ **<u>ඡායා පිටපත් කට්ටල දෙකක්</u>** බැගින්ද රැගෙන ආ යුතුය. **<u>මෙම සහතික වෙනත් දිනකදී ඉදිරිපත් කිරීමට ඉඩ දෙනු නොලැබේ.</u>**

I. දහම් පාසල් අවසාන විභාග සහතිකය හෝ වෙනත් ආගම් සඳහා ඒ හා සමාන මට්ටමේ විභාගයක් සමත් වී ඇති බවට පිළිගත් සහතිකයක්.
II. ක්‍රීඩා, සෞන්දර්ය ආදී විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා රජයේ හෝ රජය පිළිගත් ජාතික මට්ටමේ ප්‍රථම, දෙවන, තෙවන ජයග්‍රහණ ලබාගත් සහතික.

**සටහන -**

**ඉහත සඳහන් සහතික හැර වෙනත් සහතික සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.**

04. ඔබ මෙම සම්මුඛ පරික්ෂණයට ඉදිරිපත්වීම, ප්‍රායෝගික පරීක්ෂණයට ඉදිරිපත්වීමට හෝ පත්වීමක් ලැබීමට අනිවාර්ය හිමිකමක් නොවන බව සැලකිය යුතුය.

05. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණීමේ දී මෙම වෙබ් අඩවියේ පළ කර ඇති ප්‍රකාශ පත්‍රය සම්පූර්ණ කර රැගෙන ආ යුතු බවද සලකන්න.

**ඊ.එම්.පී. ඒකනායක,**
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.